## 2.8. ශුද්ධ වූ සභාවේ ගිහි ධර්මදූත සේවය.



ශු. සභාව යනු දේව ජනතාවගේ සමාජයයි. දේව රාජ්‍යයේ සමාජයයි. මෙහි සාමාජිකයන් සියලු දෙනා ම තුළ සමානාත්මතාවයේ සහෝදරත්වයේ ගුණාංගවලින් පූර්ණ ය. ඔවුන් සියලු දෙනා ම තම තමාගේ කැඳවීම මත ලෝකයට යවනු ලැබූ බව දෙවන වතිකාන කතිකාවේ සඳහන් වේ.

ශුද්ධ වූ සභාව, දේව ජනතාවගේ සමාජීය ස්වභාවයන් දෙවි පියාණන්ගේ ගැලවීමේ සැලැස්ම සමඟ එක්කරයි. ශුද්ධ වූ සභාව යනු ප්‍රසාද ස්නාපනීය කැඳවීම ලැබූ දේව ජනතාව ය; ශුද්ධ වූ ජනතාවයි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

"ඔබ සියල්ලන් ක්‍රිස්තුන් ජේසුස් වහන්සේ තුළ එක් කෙනකු මෙන් සිටින නිසා, ජුදෙව්ග්‍රීක භේදයවත්, දාසනිර්දාස භේදයවත්, ස්ත්‍රීපුරුෂ භේදයවත් නැත."

(ගලාති 3:28)

"මේ සියලු දීමනා, තමන් කැමති පරිදි, වෙන් වෙන් වශයෙන් එකිනෙකාට බෙදා දෙන්නේ එක ම ආත්මයාණන් වහන්සේ ය. මනුෂ්‍ය ශරීරයේ බොහෝ අවයව තිබුණත් ඒ අවයව විවිධාකාර වුවත් ඒ සියල්ල එක ම ශරීරයක් වන්නාක් මෙන් ක්‍රිස්තුන් වහන්සේත් එක ම ශරීරයක් වන සේක."

(1 කොරෙන්ති 12:1112)

**දෙවියන් වහන්සේ**
**(තමන්වහන්සේට හිමි)**
**ක්‍රිස්තියානි ගිහි ජනතාවක් තෝරා ගෙන ඇත්තේ ඔවුන්ගේ පෞද්ගලික යහපත සඳහා නොව තමන් ලද වරප්‍රසාද තුළින් සියල්ලන්ගේ පොදු යහපත සඳහා ධර්ම දූත සේවයේ යෙදවීමට ය.**

**ගිහියා හා පූජකයා යන කණ්ඩායම් දෙකින් ම සැදුම් ලත් දේව ජනතාව එක ම ශුද්ධවන්තභාවයට කැඳවා ඇති හෙයින් දෙපිරිසට ම ඉටු කළ යුතු ධර්මදූත සේවා රාශියකි.**

**එහෙයින් ගිහියා විසින් ඉටු කළ යුතු ධර්මදූත කාර්යභාරය කුමක් ද?**

**එය ඉටු කළ යුත්තේ කෙසේ ද? යන්න විමසා බැලීම සෑම ගිහියකුගේ ම යුතුකමකි.**

**(ශු. සභාව අංක 37)**

**පංතියේ සිසුන් කණ්ඩායම්වලට බෙදී ක්‍රියාකාරකම්වල යෙදෙන්න.**

- දෙවෙනි වතිකාන කතිකාවේ ක්‍රිස්තුන් වහන්සේගේ සභාව නමැති විශ්ව ලේඛනයෙහි ගිහියාගේ වගකීම් හා සේවාවන් පිළිබඳ සඳහන් තොරතුරු සෙවීමට පහත බයිබල් පාඨ කියවා උපයෝගී කරගන්න.
  (යෙසායා 49:6 අපෝ. ක්‍රියා 1:68)

- ජේසුස් වහන්සේ මෙලොවින් සමුගැනීමට පෙර අපෝස්තුලුවරුන්ට ත්‍රිවිධාකාර බලතල දුන් සේක. ප්‍රසාද ස්නාපනය තුළින් ලැබූ කිතුනු කැඳවීම අනුව ගිහියන් තම ජීවිත ගත කරන්නේ කෙසේ ද? යන්න සාකච්ඡා කර නිගමනයන් අභ්‍යාස පොතෙහි ලියන්න.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයට පසුව විශ්වාසිකයෝ ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගිකමෙහි ද රොටි කැඩීමෙහි ද යාච්ඤාවෙහි ද නිරත ව කල් ගත කළහ.

## කියවන්න.

"ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගිකමෙහි ද රොටි කැඩීමෙහි ද යාච්ඤාවෙහි ද නිරත ව කල් ගත කළහ. සියලු දෙනා තුළ ගෞරවාන්විත භීතියක් ඇති විය. ප්‍රේරිතවරුන් අතින් බොහෝ අරුම පුදුම දේ හා ලකුණු සිදු විය. සැදැහැවත් සියල්ලෝ එක් වී හැම දෙය ම පොදුවේ තබාගත්හ. ඔව්හු තමන්ගේ ඉඩකඩම් හා දේපල විකුණා එකිනෙකාගේ වුවමනාවේ හැටියට සියලු දෙනා අතර බෙදාගත්හ. තව ද, ඔව්හු දිනපතා නොකඩවා ම, එක්සිත්ව දේව මාලිගාවේ රැස්වෙමින් ද ගෙයින් ගෙට යමින් රොටි කඩමින් ද තම තමන් අතර ප්‍රීතියෙනුත් ත්‍යාගිවන්ත සිතිනුත් ආහාර බෙදාගනිමින් ද දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් හා සියල්ලන්ගේ ප්‍රසාදය ලබමින් ද කල් යැවූ හ. සමිඳාණන් වහන්සේ ගැළවීම ලබන්නන්ගේ ගණන දවසින් දවස වැඩිකර වදාළ සේක."

(ක්‍රියා 2:4247)

මෙ වැන්නෝ පිනීසිය, සයිප්‍රසය, අන්තියෝකය වැනි ප්‍රදේශවලට ගොස් දේව වචනය ප්‍රකාශ කළහ. පාවුළු තුමාගේ ගමනේ දී එතුමාගේ ධර්මදූත කාර්යයට ගිහි ජනතාව උදව් කළහ.

## මුල් කිතුනු සභාවේ ගිහි දායකත්වය:

ක්‍රිස්තුන් වහන්සේ තම දූත කාර්යය සඳහා ගිහියන් අතරෙන් ශ්‍රාවකයන් දොළොස් දෙනා තෝරා පත් කරගත් සේක. මෙම පිරිසට විශේෂ බලතල මෙන් ම නියෝග ද දුන් සේක.

- රෝග සුවකිරීමේ වරය
- යක්ෂයන් කෙරෙහි අධිකාරි බලය
- දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමේ බලය

> දෙවියන් වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශ කරන පිණිසත්, රෝගීන් සුව කරන පිණිසත් ඔවුන් යැවූ සේක. (ලූක් 9:2)

පවරා ඔවුන් පිටත් කර යැවූ සේක. තව ද ඔවුනට විශේෂ උපදෙස් රාශියක් දුන් සේක.

- චාරිකාව සඳහා කිසිවක් නො ගන්න.
- සැරයටියක් වත් මල්ලක් වත් රොටි වත් කමිස දෙකක් වත් නො ගන්න.
- යම් නිවසකට ඇතුළු වූ කල එ තැනින් පිටත් ව යනතුරු එහි ම රැඳී සිටින්න.

> තව ද ඔවුන් වහන්සේ ඔවුන්ට කතා කොට, 'චාරිකාව සඳහා කිසිවක් නොගන්න; සැරයටියක්වත් මල්ලක්වත් රොටිවත් මිල මුදල්වත් කමිස දෙකක් වත් නොගන්න. ඔබ යම් කිසි නිවෙසකට පිවිසි කල, එතැනින් පිටත්ව යන තුරු එහි ම නැවතී සිටින්න. ඔබ නොපිළිගන්නා යම් පමණ කෙනෙක් ඇද්ද, ඒ නුවරින් නික්ම යන කල ඔවුන්ට විරුද්ධව සාක්ෂියක් වන පිණිස, ඔබේ පාද යට තිබෙන දූලි ගසා දමන්නැ' යි වදාළ සේක. ඔව්හු පිටත්ව රට පුරා සුබ අස්න දේශනා කරමින් ද, රෝග සුව කරමින් ද ගමින් ගමට ගියහ. (ලූක් 9:36)

ධර්මදූතයා තම සේවයේ දී ගත කළ යුතු සරල අල්පෙච්ඡ ජීවිතය ගැන මෙන් ම ලෞකික දේ මත නොරඳා දිව්‍ය සංරක්ෂණය මත යැපිය යුතු බව ද තම කම අමතක කළ යුතු බව ද වටහා දෙයි.

තව ද සමූහ ලෙස ධර්මදූත සේවයේ යෙදිය යුතු බව උගන්වා වදාළ සේක. ජේසුස් වහන්සේ විසින් ම පුරුදු පුහුණු කළ මෙම ගිහි ධර්මදූත කණ්ඩායමට තව බොහෝ දෙනා එක්වූහ. ලූක් 10:1 කොටසින් සඳහන් වන පරිදි සැත්තෑ දෙනෙකුගෙන් යුත් ධර්මදූත පිරිසක් උන්වහන්සේ පිහිට වූ සේක. තමාගෙන් පසු දේව රාජ්‍යය මෙලොව පතල කිරීම අරමුණු කර ගත් මෙම පිරිස තම ජීවිත පරදුවට තබමින් සාක්ෂි දැරූහ. එහි ප්‍රතිඵලයකි අද ශු. සභාව තුළ සේවය කරන ගිහි ධර්මදූතවරු. ඔවුහු ද ගිහි අපෝස්තලික සේවාව සඳහා ලෝකය වෙත යවනු ලැබ සිටිති. ප්‍රසාද ස්නාපනය තුළ මෙම කැඳවීම ලබා ඇත.

## පොදු පූජකවරය මගින් ක්‍රිස්තුන් වහන්සේගෙන් ගිහියා ලබා ඇති ත්‍රිවිධ දිවැසි, පූජක, එඬේරික කාර්යයන්

### දිවැසි කාර්යයන්

* දහම් පාසැල්වල ඉගැන්වීම.
* ගිහි දූත සේවාව.
* දේව ධර්මය හැදෑරීම.
* ජන මාධ්‍ය භාවිත කිරීම.
* භාවනා මෙහෙයවීම.
* බයිබල් පාඨමාලා පැවැත්වීම.

### පූජක කාර්යයන්

* හදිසි අවස්ථාවල දී ප්‍රසාද ස්නාපනය දානය කිරීම.
* කියවීම් සඳහා දායකවීම.
* පුඳසුන් සේවය.
* දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව පැවැත්වීම.
* යාම යැදුම කියවීම.
* සක්‍රමේන්තු සඳහා අපේක්ෂකයින් සූදානම් කිරීම.
* දිව්‍ය සත්ප්‍රසාදය බෙදා දීම.
* මෙහෙයයන් පැවැත්වීම.

**එඬේරික කාර්යයන්**

* **සභාවේ ක්‍රියාකාරිත්වයට දායකවීම.**
* **සභාවේ දියුණුව සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.**
* **පදවිය තුළ ගිහි දායකත්වය.**

## ගිහි ආධ්‍යාත්මිකත්වය:

මුල් යුගයේ ආධ්‍යාත්මිකත්වය සොයා තපස් දිවියට ඇතුළුවීමට හෝ වන ගත වීමට අවශ්‍ය බව පිළිගැනුන ද දෙවැනි වතිකාන කතිකාවතේ ඉගැන්වීම් අනුව ශුද්ධවන්තභාවය පොදුවේ සැම කෙනකුගේ ම ජීවිත තුළින් ප්‍රකාශ විය යුත්තක් බව ය. ක්‍රිස්තියානි ශුද්ධවන්තකම අපට ලැබෙන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම මරණය හා උත්ථානය යන පාස්කු අභිරහසට අප සම්බන්ධ වන තරමට ය. සැම කෙනකු ම ශුද්ධවන්තකමට කැඳවා ඇත. ජීවිතයේ කැඳවීම කුමක් වුවත් තමාගේ වගකීම හරිහැටි ඉටුකිරීම මඟින් ශුද්ධවන්තකම ලබා ගත හැකි ය. මේ සඳහා ප්‍රේමයේ ජීවිතයක් ගතකිරීම අත්‍යවශ්‍ය ය.

- සිසුන් කණ්ඩායම් පහකට බෙදී අදාළ මාතෘකා යටතේ කරුණු රැස්කර පංතියට ඉදිරිපත් කරන්න.

1. වින්සන් ද පාවුලා සමිතිය
2. කිතු දන පුබුදුව
3. ධර්මදූත ළමා සමාජය
4. ල. ක්‍රි. වි. සමාජය
5. පුදසුන් සේවක සමිතිය

- ප්‍රසාද ස්නාපනය මඟින් ඔබ ලබා ඇති පොදු පූජකවරයේ ත්‍රිවිධ කාර්යයන් ඔබේ පාසැල හා මීසම තුළ ක්‍රියාවට නංවන අයුරු පෙන්වා දිය හැකි ද?